## විධායක සාරාංශය

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය තුළ සංක්‍රමණය වීම ප්‍රධාන භූමිකාවක් උසුලන අතර ඉදිරියේදීත් එය එසේම වනු ඇත. මෑත වර්ෂයන්හිදී, ශ්‍රී ලාංකීය ශ්‍රමිකයන් පිටතට ගලායාම වර්ධනයවීමේ නැඹුරුවක් පෙන්නුම් කෙරේ. විදේශ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික වාර්තාව (2010), මිලියන 1කට වැඩි ශ්‍රී ලාංකිකයින් පිරිසක් විදේශයන්හි සේවය කරමින් සිටින බවට තක්සේරු කර ඇත. 2000 සහ 2010 අතර කාල පරිච්ඡේදය තුළදී, රැකියාවන් සඳහා රට හැර යන සංඛ්‍යාව 182,188 සිට 266,445 දක්වා වැඩි වී ඇත. සංක්‍රමිකයින්ගේ සංඛ්‍යාව විශාලවීමත් සමග, රට තුළට ගලා එන ප්‍රේෂණයන්ගේ ප්‍රමාණය 2010 වර්ෂයේ ඇමරිකානු ඩොලර් බිලියන 4.1 හා සසඳන විට 2011 වර්ෂයේදී ඇමරිකානු ඩොලර් බිලියන 5.1ක් දක්වා විශාල වැඩිවීමක් දක්නට ඇත.

මෙම පැතිකඩෙහි අරමුණ හා අභිප්‍රාය වන්නේ ශ්‍රී ලංකාවේ සංක්‍රමණයවීමේ සමස්ත තත්ත්වය පිළිබඳව සමාලෝචනය කිරීමයි. විශේෂයෙන්ම, මෙම පැතිකඩෙහි අදහස වන්නේ විවිධ වර්ගයේ සංක්‍රමණිකයින්, ඔවුන්ගේ ස්වභාවය, ප්‍රතිවිපාක සහ ශ්‍රී ලංකාවේ සංවර්ධන ප්‍රතිඵලයන්ට ඊහි දායකත්වය සම්බන්ධ තොරතුරු සලකුණු කිරීම සහ විශ්ලේෂණය කිරීමයි. එමෙන්ම මෙම ලිපියෙන් ශ්‍රී ලංකාවේ සිට සංක්‍රමණයවන්නන් කෙරෙහි අවධානය යොමුකරමින් අන්තර් ජාතික සංක්‍රමණය වීම සම්බන්ධව ප්‍රධාන අභියෝග පෙන්වා දීමට ද අදහස් කෙරේ. සංක්‍රමණිකයින්ගේ මුල් රටවල සහ ඔවුන් යන ගමනාන්ත රටවල රජයන්ට සහ පාලන ආයතනයන්ට සංක්‍රමණය ආශ්‍රිත ගැටළු කාර්යක්ෂමව විසඳා ගැනීමට මෙය ඉවහල් වේ. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට ශ්‍රම පිටත සංක්‍රමණය වීම ඉතා වැදගත් වීම නිසා සහ වෙනත් වර්ගයේ සංක්‍රමණයන්ට අදාළ දත්තයන් සීමාවීම හේතුවෙන් මෙම පැතිකඩ මූලික වශයෙන් ශ්‍රම පිටතට සංක්‍රමණය වීම විශ්ලේෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

මෙම පැතිකඩ තුළින් සංක්‍රමණික ඉතිහාසය මෙන්ම එහි විවිධ හැඩතලයන් පිළිබඳ විස්තරාත්මක තොරතුරුද ඇතුළුව ශ්‍රී ලංකාවේ සංක්‍රමණය පිළිබඳ සමස්ථ විශ්ලේෂණයක් ලබා දේ. 1970 දශකය තුළදී විශාල ප්‍රමාණයෙන් සංක්‍රමණය වීම සඳහා දායක වූ ප්‍රධානතම හේතුවලින් එකක් වූයේ මැද පෙරදිග රටවල තෙල් මිල ඉහළ යාම බවට මෙම පැතිකඩ තුළින් කරුණු ගෙනහැර දක්වයි. 1970 දශකයේ අවසන් භාගයේ සිට, මැද පෙරදිග කලාපය ශ්‍රී ලංකාවේ ශ්‍රමය සඳහා ප්‍රධාන වෙළෙඳ පොළ වශයෙන් එහි තත්ත්වය පවත්වාගෙන ඇත. 2009 දී, සවුදි අරාබිය, කටාර් රාජ්‍යය, කුවෙයිට්, එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ ජෝර්දානය ශ්‍රී ලාංකීය ශ්‍රම සංක්‍රමිකයින්ගෙන් 86%ටත් වඩා ලබාගෙන ඇත. පසුකාලීනව, දකුණු කොරියාව, සිංගප්පූරුව වැනි නැගෙනහිර ආසියාතික රටවල් සංක්‍රමණිකයන් සඳහා නව ගමනාන්තයන් වශයෙන් නැගී එමින් පවතී. ශ්‍රී ලංකාව නුපුහුණු ශ්‍රමය සඳහා තවමත් ප්‍රසිද්ධියක් උසුලයි. 2010 වර්ෂයේදී, මුළු සංක්‍රමිකයන්ගෙන් 26.69% ක් පුහුණු ශ්‍රමය වූ අතර වෘත්තීමය සේවාවන් 1.12% ක්ද, මධ්‍යම මට්ටමේ ශ්‍රමිකයින් 2.52% ක් සහ ලිපිකාර සේවකයින් 2.93% ක් විය. සංක්‍රමණ සේවකයින්ගෙන් බහුතරය වයස අවුරුදු 25-29 අතර වයස් කාණ්ඩයෙන් සමන්විත වූ අතර 2000 දශකයේ ආරම්භය දක්වාම කාන්තාවන් ශ්‍රී ලාංකික සංක්‍රමික සේවකයන්ගෙන් ප්‍රමුඛතම කණ්ඩායම බවට පත් වී තිබේ. කෙසේවෙතත්, වර්තමානයේදී කාන්තා සංක්‍රමණිකයන් හා පුරුෂ සංක්‍රමණිකයන් සමාන වශයෙන් දැකිය හැකි අතර 50% ක් පමණ පිරිමි සංක්‍රමණිකයන් වේ. මෑත වර්ෂවලදී, සියළුම සංක්‍රමිකයින් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචිකිරීම අනිවාර්ය කිරීම සහ පැමිණිලි සඳහා හදිසි දුරකථන අංකයක් පිහිටුවීමත් සමග, ශ්‍රී ලංකාව නීති විරෝධී සංක්‍රමණයන් වැලැක්වීම සඳහා සැහෙන උත්සාහයක් දරා ඇත.

මෙම වාර්තාවේ තෙවන කොටස ශ්‍රී ලාංකීය ඩයස්පෝරාව (විදේශයන්හී ජීවත්වන මෙරට පුරවැසියන්) පිළිබඳ අවධානය යොමු කරයි. මෙම වාර්තාව තුළින් ඩයස්පෝරාව යන සංකල්පය මගින් මෙරටින් පිට ජීවත්වන ප්‍රජාවන්, තාවකාලික වශයෙන් විදේශයන්හි සංක්‍රමණ සේවකයින්, විදේශයන්හි පුරවැසිභාවය සහිතව සිටින මෙරට වැසියන්, ද්විත්ව පුරවැසියන්, දෙවන/තෙවන පරම්පරා සංක්‍රමිකයින් ආවරණය කරයි. ශ්‍රී ලාංකික ඩයස්පෝරාව ලෝකය පුරාම පැතිරී ඇතත් ප්‍රධාන කලාප කිහිපයකට කේන්ද්‍රගත වී පවතී. කැනඩාව, එක්සත් රාජධානිය, බටහිර යුරෝපය, මැද පෙරදිග සහ ඕස්ට්‍රේලියාව ශ්‍රී ලාංකීය සංක්‍රමිකයින්ගේ සිත්ගන්නා ප්‍රධාන ගමනාන්තයන් කිහිපයක් වේ. එක්සත් රාජධානියට සහ ඕස්ට්‍රේලියාවට යාම පසුගිය දශකය ආරම්භයේ සිට ඉහළ ගොස් ඇත. සිංහලයින් බහුතරයක් සිටින ගල්ෆ් රාජ්‍යයන් හා ඉතාලිය හැරුණු විට ඉහත සඳහන් කලාප තුළ ජීවත්වන ශ්‍රී ලාංකිකයින්ගෙන් බහුතරය දෙමළ ජාතිකයෝ වෙති. 1983 බෙදුම්වාදී යුද්ධයේ ආරම්භයත් සමගම, දෙමළ ඩයස්පෝරාව ශ්‍රී ලංකා දේශපාලනයේ ප්‍රධාන අංගයක් විය. විදේශයන්හි දෙමළ ප්‍රජාව ප්‍රේෂණයන් එවීම තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයට දායක වේ. දෙමළ ප්‍රජාව බහුලව ජීවත්වන උතුරු හා නැගෙනහිර පළාත්වල බොහෝ නිවාස විදේශයන්ගෙන් ලැබෙන ප්‍රේෂණයන් මත ප්‍රමුඛ වශයෙන් විශ්වාසය තබා ඇත.

හතරවැනි කොටස ශ්‍රමය පිටතට සංක්‍රමණය වීම තුළින් සංවර්ධනයට ඇතිවන බලපෑම පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වෙන් කර ඇත. රැකියාවන් සඳහා අන්තර් ජාතික ඉල්ලුම සහ ශ්‍රී ලාංකීය සැපයුම් ශක්‍යතාවය අතර විශාල නොගැලපීමක් දක්නට ඇත. විදේශීය රටවල් විසින් ඉල්ලනු ලබන විශේෂිත නිපුණතාවයන් සම්බන්ධයෙන් මෙම නොගැලපීම වඩාත් තීව්‍ර වේ. විදේශීය රටවලින් ප්‍රධාන වශයෙන්ම පුහුණු ශ්‍රමය ඉල්ලුම් කරන අතර ශ්‍රී ලංකාවේ ශ්‍රම සැපයුම ගෘහ සේවිකාවන් සහ වෙනත් අඩු නිපුණතා වර්ගයන්ට කේන්ද්‍ර ගත වේ. උදාහරණයක් වශයෙන්, 2010 වර්ෂයේදී ලද රැකියා ඇබෑර්තුවලින් 64%ක් භාවිතයට ගෙන නොමැත. එකම රැකියා ඇණවුම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ විවිධ විදේශ රැකියා නියුක්ති ආයතන අතරේ බෙදා දීම තුළින් රැකියා ඇබෑර්තු ප්‍රමාණය අස්වාභාවික ලෙස වර්ධනය කර පෙන්වයි. අනාගතය සඳහා සැපයුම් අවශ්‍යතාව විශ්ලේෂණය කිරීමට අනුව, අනාගතයේදී සැපයුම වැඩි වන්නේ උපයෝජනය නොකරනු ලබන ඇබෑර්තු අඩු මට්ටමක පවතින රැකියාවන්වල වන අතර උපයෝජනය නොකරනු ලබන ඇබෑර්තු ඉහළ මට්ටමක පවතින රැකියා පිළිබඳ සැපයුම අඩු අනුපාතයකින් වර්ධනය වේ.

මැද පෙරදිග ශ්‍රී ලංකාවේ විශාලතම ප්‍රේෂණ සම්පත වශයෙන් අර්ථ දැක්විය හැකිය. 2010 වර්ෂයේදී, මුළු ප්‍රේෂණයන්ගෙන් 60%ක් මැද පෙරදිග කලාපයෙන් ලැබුණි. ශ්‍රී ලංකාව තුළට ප්‍රේෂණයන් ගලා ඒම පසුගිය වර්ෂයන් තුළ ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර 2010 දී එය දළ දේශීය නිෂ්පාදනයෙන් 8%ක් විය. රටක් දේශීය වශයෙන් කම්පනයන්ට මුහුණ දෙන අවස්ථාවක ප්‍රේෂණයන් නිතරම එයට එරෙහිව චක්‍රීය භූමිකාවක් ඉටු කර ඇත. 2004 සුනාමි ව්‍යාසනයට පසුව ශ්‍රී ලංකාව එහි ඉහළම ප්‍රේෂණයන් ගලා ඒම 2005 වර්ෂයේදී දැකීමට හැකි වූ අතර එය දළ දේශීය නිෂ්පාදනයෙන් 8% දක්වා ඉහළ වර්ධනයකි. ප්‍රේෂණයන් ගලාඒම දුර්වල වෙළෙඳ ශේෂය හමුවේ ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයට ආධාර වීම සඳහා ප්‍රබල වශයෙන් දායක වී ඇත. 2010 දී, ප්‍රේෂණයන් අපනයන ආදායමින් 49%කට, ආනයන වියදමින් 30%කට සහ ගෙවුම් ශේෂයේ මුළු ජංගම ලැබීම්වලින් 27%කට දායක විය. ප්‍රේෂණයන් ගලා ඒමේ ප්‍රතිඵලයක් වශයෙන් වඩා ඉහළ ජාතික ඉතුරුම් සහ ආයෝජන අනුපාතයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකාවට හැකි වී ඇත.

සංක්‍රමණය නිසා ශ්‍රී ලංකාව තුළ ශ්‍රම වෙළෙඳපලට බලපෑම් ඇති වේ. සංක්‍රමණ සේවකයින්ගෙන් බහුතරය නුපුහුණු ශ්‍රමිකයින් වන බැවින් මුළු දේශීය ශ්‍රම වෙළෙඳපල මත විදේශ රැකියා සඳහා ඔවුන්ගේ බැහැරවීමේ බලපෑම ආන්තික වේ. එවැනි නුපුහුණු සේවකයින්ගේ සංක්‍රමණය ගෘහස්ථමය ව්‍යාපාරවලට සහ පවුලේ වෙනත් ආදායම් උපයනු ලබන ක්‍රියාවන්ට බලපානු ලැබිය හැකිය. අවශ්‍ය තොරතුරු හා දත්ත නොමැතිවීම නිසා වේතනයන් මත සංක්‍රමණයේ බලපෑම ගණනය කිරීම වඩාත් දුෂ්කර වේ. කෙසේ වෙතත්, ඉදිකිරීම් වැනි සමහර අංශයන්ගෙන් ලබාගත හැකි සාධක අනුව එම බලපෑම ඉතා වැදගත් විය හැකි බව අනුමාන කළ හැකිය. තව දුරටත්, ඉතා පුහුණු සංක්‍රමණය සමහර අංශයන්ට දැඩි සේ බලපෑ හැකිය. සෞඛ්‍ය අංශය තුළ, කලාපයේ අනෙකුත් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් රටින් පිටව යාමේ අනුපාතය ඉහළම අගයක් ගන්නා අතර හෙදියන් මෙරටින් OECD රටවලට පිටව යාමේ අනුපාතය තුන්වැනි ස්ථානයේ පසුවේ. රටවල් 157ක් අතරින් වෛද්‍යවරුන් සියරටින් පිටතට යාමේ අනුපාතය අනුව ශ්‍රී ලංකාව 37 වන ස්ථානයේ පසුවන අතර එයට අනුරූපව හෙදියන් 66 වන ස්ථානයේ පසුවිය. සේවා ව්‍යුක්ති අනුපාතයෙහි සීඝ්‍ර අඩුවීමක් පෙන්නුම් කරන රටක් වශයෙන්, දේශීය ආර්ථිකය සඳහා අවශ්‍ය වන ශ්‍රම සංචිතය ලබාගත හැකි අයුරින් පිටතට සිදුවන සංක්‍රමණය සැළකිලිමත් ලෙස කළමණාකරණය කළ යුතු වේ.

ගෘහස්ථයන්ගේ මූලික අවශ්‍යතාවන් ඉටුකර ගැනීමට අවස්ථා සැලසීම, අහිතකර කම්පනයන්ගෙන් ආරක්ෂා වීමට ඔවුන්ට ඇති හැකියාව වර්ධනය කිරීම, ඉඩම් සහ වෙනත් ඵලදායි වත්කම් මිලදී ගැනීමට ඔවුන්ට ඉඩ ලබා දීම, ඔවුන් ණයගැතිභාවයන්ගෙන් නිදහස් කර ගැනීම, කුඩා පරිමාණ ව්‍යවසාය සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යාපනය සහ සෞඛ්‍ය තුළ ආයෝජනය වැඩි කිරීම වැනි අංශයන් කිහිපයකින් ප්‍රේෂණයන් ක්ෂුද්‍ර මට්ටමේ බලපෑමක් ඇති කරයි. 2009/10 ගෘහස්ථ ආදායම් සහ වියදම් දත්ත අනුව සංක්‍රමණ ගෘහස්ථයන් විසින් ආහාර, ආහාර නොවන ද්‍රව්‍ය, අධ්‍යාපනය, සෞඛ්‍ය, කල් පවත්නා භාණ්ඩ සහ නිවාස වෙනුවෙන් එක් මාසයකදී සංක්‍රමණ නොවන ගෘහස්ථයන්ට වඩා වැඩියෙන් වියදම් සිදුකර ඇත. එසේ වුවත්, සංක්‍රමණ සහ සංක්‍රමණ නොවන ගෘහස්ථයන් අතර පාසල්වලට ඇතුළත්වීම සහ රෝගාතුරවීමේ මට්ටම්වල දර්ශකයන් සම්බන්ධයෙන් සංඛ්‍යානුකූලව සැලකිය යුතු මට්ටමේ වෙනසක් නොමැත.

හේතූන් කිහිපයක් නිසා සංක්‍රමණයේ සෞඛ්‍ය බලපෑම ශ්‍රී ලංකාව තුළ වැදගත් කාරණයක් බවට පත් වෙමින් තිබේ. මෙම අර්ථයෙන්, ශ්‍රී ලංකා රජය සංක්‍රමිකයින් පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය සමග එකතු වී සංක්‍රමණ සෞඛ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය හරහා සංක්‍රමණ සේවකයින්ගේ සහ ඔවුන්ගේ පවුල් සඳහා මනා සෞඛ්‍ය මට්ටමක් සහතික කිරීම පිණිස ප්‍රයත්නයන් දරමින් සිටී. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන්නේ සංක්‍රමණය සහ සෞඛ්‍ය පිළිබඳ ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ ව්‍යාපෘතියයි. මෙම පර්යේෂණයන්ගේ සොයාගැනීම්වලින් ශ්‍රී ලාංකික සංක්‍රමිකයින් බෝවිය හැකි රෝග පිළිබඳව හොඳින් දැනුවත් වී ඇති බවත් ප්‍රතිචාර දැක්වූවන්ගෙන් කුඩා ප්‍රමාණයක් පමණක් ප්‍රධාන වශයෙන් බෝනොවෙන රෝගයන්ගෙන් පෙළී ඇති බවත් සොයා ගෙන ඇත.

විනිමය පාලන පනතේ 4 වගන්තියට අනුව අවසරලත් වාණිජ බැංකුවක්ම ශ්‍රී ලංකාවේ විදේශ විනිමය සම්බන්ධයෙන් බලයලත් ගනුදෙනුකරු වශයෙන් කටයුතු කරයි. එයට අමතරව, ශ්‍රී ලංකාවේ මහා බැංකුව විසින් විදේශ විනිමය නෝට්ටු මිලදී ගැනීම සඳහා සහ එම මුදල් වෙනත් ඕනෑම මුදලකට හුවමාරු කිරීම සඳහා බලයලත් මුදල් හුවමාරු කරන්නන් පත් කරනු ලැබ ඇත. සංක්‍රමණ ප්‍රේෂණයන් අනුව, සංක්‍රමණයින්ට සේවාවන් ලබාදෙනු ලබන ප්‍රධාන ආයතන තුන හඳුනාගැනීම පහසුය. එනම් (i) වාණිජ බැංකු, (ii) මුදල් හුවමාරු ව්‍යාපාරයන් සහ (iii) ශ්‍රී

ලංකා තැපැල. එම ආයතනයන් විසින් ප්‍රේෂණයන් හුවමාරු කර දීම සඳහා මනාව දියුණුකරන ලද නිෂ්පාදනයන් පවත්වාගෙන යන අතර ඔවුන්ගේ සේවය සඳහා කැපවීමද ඉතා යහපත් වේ. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලන කල ප්‍රේෂණයන්ගෙන් සැලකිය යුතු මට්ටමක ප්‍රමාණයක් මූලික වශයෙන් අවිධිමත් මුදල් හුවමාරු ක්‍රමයන් තුළින් තවමත් ගලා එමින් පවතී.

පස්වැනි කොටසින් ශ්‍රී ලංකාවේ සංක්‍රමණ සේවකයින් මුහුණ දෙන ගැටලු සහ ඔවුන්ට ලබාගත හැකි සමාජ සුභ සාධන පහසුකම් පිළිබඳ විස්තර වේ. රැකියාවක් සඳහා පිටත්වන මුල් අවදියේදී සංක්‍රමිකයින්ගෙන් බහුතරය රැකියාවක් ලබා ගැනීම පිළිබඳ තොරතුරු සොයා ගැනීමේදී අවිධිමත් ජාලාවන් කෙරෙහි විශ්වාසය තබයි. රට තුළ ඇති ව්‍යාජ රැකියා නියෝජිතායතන සහ අධික පොලී අනුපාතයට සංක්‍රමිකයින්ට ණය ලබා දෙන මුදල් ණයට ලබා දෙන පුද්ගලයින් නිසා සංක්‍රමණය සඳහා ආරම්භක කාර්යයන්ට සම්බන්ධ වීමේදී ඉතා ඉහළ අවදානම් දැරීමට සිදුවිය හැකිය. සංක්‍රමණ පිරිවැය සඳහා මුදල් යෙදවීම සංක්‍රමණ සේවකයින්ට, විශේෂයෙන් ශ්‍රී ලංකාවේ පුරුෂ සංක්‍රමණ සේවකයින්ට, මුහුණු දීමට සිදුවන ප්‍රධාන ගැටළුවක් වේ. දරුවන් රැක බලා ගැනීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාව තුළ පැතිරුණු විස්තීර්ණ පවුල් ක්‍රමය ප්‍රධාන කාර්යයභාරයක් ඉටු කරයි. එසේ වුවත්, එය කාන්තා සංක්‍රමණිකයින් විසින් පොදුවේ මුහුණු දෙනු ලබන තවත් දුෂ්කරතාවකි. ගමනාන්තයේදී ද සංක්‍රමණ සේවකයින් දුෂ්කරතාවයන්ට මුහුණ දෙනු ලැබේ. කුමණ රට ආරක්ෂාකාරීද යන්න තීරණය කිරීමේදී එක් එක් රටවල සංක්‍රමණික තොගයෙන් ප්‍රතිශතයක් වශයෙන් පැමිණිලි ප්‍රමාණය සලකා බැලීම නිවැරදි දර්ශකය වේ. පැමිණිලිවලින් ඉහළම ප්‍රතිශතය එනම් සියයට 2ක් (2%) වාර්තා වන්නේ මැලේසියාවෙනි. ඊලගට ජෝර්දානය සියයට 1.5% සහ සව්දි අරාබියයි. අඩුම පැමිණිලි ප්‍රතිශතය වාර්තා වන්නේ සිංගප්පූරුවෙනි. 2010 දී, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත ලැබුණු පැමිණිලිවලින් බහුතරයක් රැකියා ගිවිසුම් කඩකිරීම (21%) සම්බන්ධයෙන් වූ අතර ගිවිසුමේ සඳහන් වැටුප් නොගෙවීමේ අවස්ථාව සියයට 20%ක් විය.

ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් සංක්‍රමණ සේවකයින් සඳහා සමාජ සුභ සාධන වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලැබේ. මේවාට විදේශ රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය, සේසත විශ්‍රාම යෝජනා ක්‍රමය, සංක්‍රමණිකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යාත්ව සහ ණය යෝජනා ක්‍රමයන් ඇතුළත් වේ. මෑතකදී ශ්‍රී ලංකා රජය විසින් සංක්‍රමණ සේවකයින්ගේ පවුල්වල සමාජ සුභ සාධනය සහතික කිරීමේ පරමාර්ථයෙන් "රට විරුවෝ" සංවිධානය පිහිටුවනු ලැබීය.

හයවැනි පරිච්ඡේදයෙන් ශ්‍රී ලංකාවේ සංක්‍රමණ ක්‍රියාවලිය පාලනය කිරීම විස්තර වේ. ශ්‍රී ලංකාව විසින් ජාත්‍යාන්තර සම්මුතීන්, ශ්‍රම ප්‍රමිතීන් සහ දේශීය වශයෙන් සම්මත කරගත් යහ පාලනය පිළිබඳ ප්‍රමිතීන් මත පදනම්ව සංක්‍රමණය පාලනය කිරීම සඳහා පියවර ගෙන ඇත. මෙම ප්‍රතිපත්තීන්ට ආයතණික රාමුව, නීතිමය රාමුව, පාලක රාමුව හා සමාජ කතිකාව සහ උපදේශන රාමුව යන ක්ෂේත්‍රයන් හතර ඇතුළත් වේ. විදේශ රැකියා ප්‍රවර්ධන සහ සුභ සාධන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය, ශ්‍රී ලංකා විදේශ රැකියා (පුද්ගලික)ආයතනය සහ බලය ලත් විදේශ රැකියා නියෝජිතායතන සංගමය සංක්‍රමණය පාලනය සිදුකරනු ලබන ආයතනයන් වශයෙන් හඳුනා ගත හැකිය. ශ්‍රී ලංකාව තුළ සංක්‍රමණය පාලනය කිරීමේ යෙදී සිටින වෙනත් අදාළ අමත්‍යාංශයන් සහ විධිමත් ආයතනයන් වන්නේ කම්කරු සබඳතා සහ මිනිස් බල අමාත්‍යාංශය, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යාංශය, බාහිර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සහ තානාපති සේවාවන්ය.

ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශය ගෘහස්ථමය සේවාවන් වැනි ක්ෂේත්‍රයන් කිහිපයක පුහුණු පාඨමාලාවන් සංවිධානය කරනු ලබයි. පුහුණු වැඩ සටහන්වලින් බහුතරය පළමු වරට ගෘහ සේවිකාවක් වශයෙන් මැද පෙරදිග කලාපයේ රැකියාවක් සොයනු ලබන කාන්තාවන් සඳහා ලබා දෙන අනිවාර්ය පුහුණු වැඩ සටහන් මාලාවයි. තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් සංක්‍රමණික සේවකයින් සඳහා ජාතික වෘත්තීමය සුදුසුකම් (NVQ) වැඩ සටහන ලබා දේ.

ශ්‍රී ලංකාව තුළ සංක්‍රමණ කළමනාකරණය සම්බන්ධයෙන් සංක්‍රමිකයින් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය, ජාත්‍යන්තර ශ්‍රම සංවිධානය සහ අවතැන්වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් ප්‍රධාන භූමිකාවක් ඉටු කරමින් සිටී.

ශ්‍රම සංක්‍රමණය පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිය ජාත්‍යන්තර ශ්‍රම සංවිධානයේ සහයෝගය සහිතව විදේශ රැකියා ප්‍රවර්ධන සහ සුභ සාධන අමාත්‍යාංශය විසින් සකස් කරන ලදී. ජාතික සංක්‍රමණික ප්‍රතිපත්තියෙහි අරමුණු වන්නේ ආර්ථිකයේ ශ්‍රම සංක්‍රමණ භූමිකාව සඳහා දිගු කාලීන දැක්මක් සංවර්ධනය කිරීම, ආර්ථිකය, සමාජය, සංක්‍රමණ සේවකයින් සහ ඔවුන්ගේ කුටුම්භයන් මත ශ්‍රම සංක්‍රමණයේ ප්‍රතිලාභ වර්ධනය කිරීම, එහි සෘණාත්මක බලපෑම් අවම කිරීම සහ අවසන් වශයෙන් සාර්ථකත්වය උදෙසා වැඩකිරීම සහ ඔවුන්ගේ සියලුම මානව සහ කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමයි. ජාතික සංක්‍රමණ ප්‍රතිපත්තිය හැරුණු විට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් වැඩි දියුනු කරන ලද සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ එච්අයිවී/ඒඩ්ස් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, යෞවන කටයුතු අමාත්‍යාංශය විසින් වැඩි දියුණු කරන ලද සංක්‍රමණ සේවකයින් සඳහා කාර්මික සහ වෘත්තීය පුහුණු ප්‍රතිපත්තිය සහ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යාංශය විසින් වැඩි දියුණු කරන ලද ජාතික හොඳ රාජකාරි (decent work) ප්‍රතිපත්තිය වැනි වෙනත් සංක්‍රමණයන්ට අදාළ ප්‍රතිපත්ති කිහිපයක් පවතී. සංක්‍රමණ සේවකයින්ගේ ආරක්ෂාව සහතික කිරීමේ සහ යහපත් තත්ත්වයේ රැකියාවන් ලබා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාව මැදපෙරදිග සහ ආසියාවේ රටවල් කිහිපයක් සමග ද්වි පාර්ශ්වීය ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම් කිහිපයක් අත්සන් කර ඇත. ආසියානු ශ්‍රමය යවන රටවල් සඳහා පොදු වේදිකාවක් ලබා දීමේ සහ සංක්‍රමණ ක්‍රියාවලිය පාලනය කිරීමේ සහ කළමණාකරණය කිරීමේ අරමුණින් සමාජ කතිකාවන් සහ උපදේශන වැඩසටහන් කිහිපයක් ආසියානු කලාපය තුළ ආරම්භ කර ඇත. කලාපය තුළ ප්‍රධාන උපදේශන ක්‍රියාවලීන් අතර කොළඹ ක්‍රියාවලිය සහ අබුඩාබි කතිකාව ද වේ.

හත්වන පරිච්ඡේදයෙන් සංක්‍රමණය පිළිබඳ සංඛ්‍යා ලේඛන ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව ඉස්මතු කරයි. ඊට අමතරව, රැකියාවන් සඳහා බඳවා ගනු ලබන ආයතන වර්ග කිරීමේ ක්‍රමයක් යොදා ගැනීම වැනි සංක්‍රමණ සේවකයින්ගේ සමාජ සුභ සාධනය සහතික කිරීම සඳහා රජය විසින් ගනු ලබන පියවර එය වැඩිදුරටත් අනාවරණය කරයි. එමෙන්ම එය සංක්‍රමණිකයින්ගේ ප්‍රතිලාභයන් උපරිම කළ හැකි මාර්ගයන් පැහැදිළි කරයි. සංක්‍රමණ සේවකයින්ගේ හැකියා වර්ධනය, සංක්‍රමණ පිරිවැය අවම කිරීම, සංක්‍රමණයට අදාළව පවත්නා ප්‍රතිපත්ති නැවත අධ්‍යයනය කිරීම සහ නව වෙළඳපල පිළිබඳ අවබෝධය සංක්‍රමිකයින්ගේ ප්‍රතිලාභ වර්ධනය කිරීම සඳහා යෙදවිය හැකි මෙවලම් ලෙස වැදගත් වේ.